පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය:- 95

ආයතනයේ නම:- ඌව පළාත් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා

සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ

නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்:- 95

நிறுவனத்தின் பெயர் :- ஊவா மாகாண சபை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 95

Name of the institution :- Uva Provincial Council

Submission of observation of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of Standing Order NO. 119(4)

2023.05.09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ ලබා දෙන ලද නියෝගවල වර්තමාන තත්ත්වය (2019/2020/2021 වර්ෂවලට අදාල)

අනු අංකය		නියෝගය	වර්තමාන තත්වය
1		බීජ අර්තාපල් ආනයනය කර බෙදා හැරීම	එහි සඳහන් පරිදි 2023.06.01දිනට බීජ අර්තාපල් ගිණුමේ හිඟ ණය ශේෂය රු: 9,298,927.13ක් වුවද, ක්‍රමක් ක්‍රමයෙන් මාසිකව ණය අය වී 2025.07.31 දින වන විට ණය ගැතියන්ගෙන් තව දුරටත් අය කර ගැනීමට ඇති හිඟ ණය ශේෂය රු:7,764,503.50 ලෙස පෙන්වා දිය හැකිය. මේ වන විට ක්‍රමයෙන් මාසිකව ණය ගෙවන පිරිසක් සිටින අතර ණය නොගෙවන ණයගැතියන් සම්බන්ධයෙන් නැවත වතාවක් ණය ගෙවීම දිරිගැන්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සාකච්ඡා පැවැත්වීමට තීරණය කර ඇත.
2		වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩමක් ගුවන් විදුලි සංස්ථාව විසින් පෞද්ගලික පාර්ශවයකට අතුරු බදු දීම	මේ සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පවතින නිසා තවදුරටත් පරීක්ෂණයක් සිදු කර නැවත පිළිතුරක් යොමු කරන බව සඳහන් කරමි.
3		හාලිඇල පරිගණක පුහුණු මධ්‍යස්ථානය	2023 වර්ෂයේ ප්‍රතිපාදන මගින් මෙම තෙමහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ වැඩ නිමකළ අතර 2024 වර්ෂයේ සිට එහි පුහුණු වැඩසටහන් සඳහා භාවිතයට ගනු ලබයි. තවද 2024 වර්ෂයේ ප්‍රතිපාදන මගින් මෙහි පළමු මහලේ වැඩ නිමකර එයද මේ වන විට භාවිතයට ගනු ලබයි. මෙම ගොඩනැගිල්ලේ ඉහල මහලේ වැඩ නිම කිරීම සඳහා 2025 වර්ෂයේ රු.මි. 27.50 ප්‍රතිපාදන වෙන්කර ඇති අතර මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. හාලිඇල සම්පත් මධ්‍යස්ථානයේ සතුව පවතින කාර්යාල උපකරණ හා භාණ්ඩ යොදා ගනිමින් මෙහි පුහුණු කටයුතු පවත්වාගෙන යන අතර මෙම වර්ෂයේ වාර්ෂික සැලසුම මගින් උපකරණ කොටසක් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. 2025 වර්ෂයේ ගොඩනැගිල්ලේ ඉහළ මහලේ කටයුතු ද නිමවීමෙන් පසු ඉතිරි භාණ්ඩ හා උපකරණ අවශ්‍යතාවය 2026 වර්ෂයේ සැලැස්ම මගින් සම්පූර්ණ කිරීමට යෝජිතය.
4		2006 වර්ෂයේ සිට 2017 වර්ෂ දක්වා ඌව පළාත් සභාව විසින් බඳවා ගනු ලැබූ පාසල් පුස්තකාල සේවක,පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු 778 සඳහා 2020 සැප්තැම්බර් මස දක්වා රු. මිලියන 132 ක පමණ වැඩිපුර මුදලක් ගෙවා තිබීම	මොනරාගල මහාධිකරණයේ නඩු අංක 02/2022ට අදාල තීන්දුව 2024.08.29 දින ලබා දුන් අතර ඒ අනුව සියළු කටයුතු සිදු කරන බව දන්වමි.එසේම එම තීන්දුවට එරෙහිව නඩු අංක 02/2022ට අදාල වගඋත්තර කරුවන් විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

5		උඩවලව සංචාරක විවේකාංගණය සහ කඩකාමර සම්බන්ධ ව්‍යාපෘතිය	මෙහි මූළුතැන්ගෙය , ආපන ශාලාව සහ කඩ කාමරවලින් කොටසක් 2023 සිට 2043 දක්වා වසර 20 ක කාලයක් සඳහා පුද්ගලික ව්‍යවසායකයෙකු වෙත රජයේ නියමිත ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කරමින් මාසික බදු කුළිය රු. 53,500.00 ක මුදලකට බදු දී ඇත. දැනට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ. ඉතිරි කඩකාමරද බදුදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
6		ඵලදායී ලෙස යොදා නොගත් ව්‍යාපෘති	ඌව පළාත් සභාවට අදාළ නැත
7		ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 153 ක් වැය කර ඉදි කර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි වූ පාලම් 5	**1844 - ගල්තැන්හේන වැලිඅරාව පාලම -2018.12.14** ඇස්තමේන්තු සකස් කර ඇති අතර, ප්‍රතිපාදන සලසාගෙන ඉදිරි කටයුතු කරනු ලැබේ. **II. 1125 - ගල්කන්දවත්ත පාලම 2016.09.08** මෙම ඉදිකර ඇති පාලම හරහා යන මාර්ගය හාපත්ගමුව හා බණ්ඩාරවෙල සාමචෛතිය දක්වා ගමන් කළ හැකි අතර දැනටමත් ප්‍රදේශවාසීන්ට විශාල ගමන් පහසුවක් ඇති කරයි. වාහන ගමනා ගමනය පහසු කිරීම සඳහා මෙහි ඇති තරමක් අධික බෑවුම අඩුකර මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. **III. 1843 - උඩුතුරේ පිටපොල පාලම 2018.12.14** මෙම පාලම හරහා යන මාර්ගය මේවන විට වාහන ගමනා ගමනය සඳහා භාවිතා කරනු ලැබේ. මෙම මාර්ගය වගා කරනු ලබන කුඹුරු හරහා යෙදී ඇති අතර, ගමන් පහසුව වැඩිකිරීම සඳහා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු සකස් කර ඇති අතර, අවශ්‍ය ප්‍රතිපාදන ලද පසු එම කටයුතු සිදුකළ හැකිය. **IV. 1130 හෙට්ටිපොලවත්ත පාලම 2016.01.05** ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් පැවති ගැටළු මේ වන විට නිරාකරණය කර ඇත. අනතුරුව, මාර්ගය සංවර්ධනය කිරීමට මාර්ගය කපන ලද නමුත් නාය යාම හේතුවෙන් සංවර්ධනය කිරීමේ කටයුතු කටයුතු මේවන විට තාවකාලිකව නතර කරන ලදී. ඉදිරියේදී ප්‍රතිපාදන සලසා ගෙන මාර්ගය පිළිසකර කිරීමට කටයුතු කරනු ලැබේ. **V. කුරුකුදේ ගම බදුවත්ත පාලම 2017.07.31** බාධාවකින් තොරව ගමනාගමනය සඳහා භාවිතා කරයි.
8		ජනාධිපති ලේකම් කාර්යාලය හා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලබනචක්‍රලේඛ මෙන් ජාතික වශයෙන් වැදගත් වෙනත් රාජ්‍ය චක්‍රලේඛ සම්බන්ධයෙන් පළාත් සභාව/පළාත් ආණ්ඩුකාරවරයා කටයුතු කළ ආකාරය	මේවන විට ඉන්ධන දීමනා සම්පූර්ණයෙන් ම නතර කර ඇති අතර, එම වාහන භාවිතයද නතර කර, වාහන වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී

9	3.1	2018 ඔක්තෝම්බර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජ්/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 7.4 ප්‍රකාරව පළාත් ප්‍රධාන අමාත්‍ය, පළාත් අමාත්‍ය,පළාත් සභා සභාපති, පළාත් සභා නියෝජ්‍ය සභාපති යන ධූර ධාරීන්ට එම තනතුරට හිමි දීමනා පමණක් හිමිවිය යුතු අතර මන්ත්‍රීවරයකු වශයෙන් ලබා ගත හැකි දීමනා නොගෙවිය යුතු බව සඳහන් වී තිබුනි. එකී ධූරධාරීන්ට ඒ ඒ අමාත්‍යාංශ හා අංශ වලින් නොකඩවාම දීමනා ලබා දී තිබියදී සභා ලේකම් කාර්යාලය විසින් 2018 නොවැම්බර් මස සිට 2019 සැප්තැම්බර් මස දක්වා වූ කාලයට ඉහත ධූරධාරීනට ඉහතදීමනාවලට අමතරව රු. 12,616,362 ක් අදාල චක්‍රලේඛයට පටහැනිව පළාත්සභා මන්ත්‍රීවරයකු වශයෙන් ලබා ගත හැකි දීමනාද ගෙවා තිබුණි.	පළාත් සභා මන්ත්‍රීවරයෙකු හා ධූරධාරියෙකු වශයෙන් කටයුතු කිරීමේදී ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් නිශ්චිත තත්වයක් හඳුනා නොගැනීම හේතුවෙන් ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2019.02.07 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී සාකච්ඡාවක් පවත්වා ඇති අතර, එහිදී තීරණය වූ පරිදි නැවත පළාත්සභා සහ පළාත්පාලන අමාත්‍යාංශ නිලධාරීන්, මුදල් අමාත්‍යාංශ නිලධාරීන් සහ ප්‍රධාන ලේකම්වරු සහ විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඇතුළු කමිටුවේ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් 2019.04.09 දින ද සාකච්ඡාවක් ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවතුණි. ඒ අනුව, ඒ සම්බන්ධව කෙටුම්පත් වාර්තා සකස් කර ඇත. කෙසේ වෙතත් 2019 වර්ෂයේදී පළාත් සභාව විසුරුවා හැර ඇති හෙයින් පළාත් සභාවේ ගරු සභාපතිවරයා වෙත මන්ත්‍රී දීමනා හැර ධූරය සඳහා පමණක් ගෙවීම් සිදු කරනු ලැබේ.
	3.3	2006 වර්ෂයේ සිට 2017 වර්ෂ දක්වා ඌව පළාත් සභාව විසින් බඳවා ගනු ලැබූ පාසල් පුස්තකාල සේවක,පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු 778 සඳහා 2020 සැප්තැම්බර් මස දක්වා රු. මිලියන 132 ක පමණ වැඩිපුර මුදලක් ගෙවා තිබීම	මොනරාගල මහාධිකරණයේ නඩු අංක 02/2022ට අදාල තීන්දුව 2024.08.29 දින ලබා දුන් අතර ඒ අනුව සියළු කටයුතු සිදු කරන බව දන්වමි. එසේම එම තීන්දුවට එරෙහිව නඩු අංක 02/2022ට අදාල වගඋත්තර කරුවන් විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

9	3.8	2018 ඔක්තෝම්බර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය යන ශීර්ෂය යටතේ නිකුත් කල අංක පීඑස්/සීඑස්ඒ/11-18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 4.1 ඡේදය අනුව ආණ්ඩුකාරවර සම්බන්ධීකරණ ලේකම් වෙත මාසිකව උපරිම ඉන්ධන ප්‍රමාණයට අදාල දීමනාවන් ලබා දී තිබියදී 2020 සැප්තැම්බර් මස සිට 2021.දෙසැම්බර් 31 දින 31 දක්වා අතිරේක ඉන්ධන ලෙස පිළිවෙළින් ඉන්ධන ලීටර 5,247.37ක් වෙනුවෙන් රු. 909,322 ක් හා ඉන්ධන ලීටර 3.420 ක් වෙනුවෙන් රු. 426,100 ක් ගෙවා තිබුණි	මේවන විට ඉන්ධන දීමනා සම්පූර්ණයෙන් ම නතර කර ඇති අතර, එම වාහන භාවිතයද නතර කර, වාහන වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී
9	3.9	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (II) ඡේදය සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 30 දෙනෙකුට 2017 අගෝස්තු සිට 2022 ජූනි මාසය දක්වා මූලික වැටුපෙන් සියයට 25 ක් වන පරිදි රු. 13,222,231 ක විශේෂ දීමනා ගෙවා තිබුණි.	ඌව පළාත් සභාවේ 2017 අංක 03 දරණ ප්‍රඥප්තිය අනුව මෙම දීමනාව ගෙවා ඇත. අංක 03/2018 දරණ 2018.07.18 දිනැති චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ මෙම ප්‍රඥප්තිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කිරීමෙන් පසු දිනෙක වේ. මාගේ අංක 4/AD/AD/08/09/11 හා 2022.08.18 දිනැති ලිපියෙන් 2022 අගෝස්තු මස සිට මෙම දීමනාව ගෙවීම අත්හිටුවා ඇත.

9	3.10	6 වන ඌව පළාත් සභාවේ සිටි පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 187 දෙනෙකුට ඔවුන්ගේ සේවය 2019 ඔක්තෝබර් මාසයේදී අවසන් වීම වෙනුවෙන් ගෙවනු ලබන අවසාන ගෙවීමක් ලෙස දක්වා, එම නිලධාරීන්ට ගෙවන ලද මාසික දීමනාවෙන් සියයට 12 ක් වන පරිදි හා ඔවුන් සේවය කළ මාස ගණන අනුව 2021 වර්ෂයේදී එකතුව රු. 8,867,895 ක් වූ පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි	මෙම පාරිතෝෂිත මුදල් ගෙවීම් කර ඇත්තේ 1988 අංක 38 දරණ පළාත් සභා වැටුප් හා දීමනා පනතේ විධිවිධානයන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල වරප්‍රසාද සැලකිල්ලට ගෙනය. ගරු මන්ත්‍රී කාර්යය මණ්ඩලය රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල අදාල කර ගෙන දායක කරගැනීමට නොහැකි වීම මත මෙම කාර්යය මණ්ඩලයට සේවය අවසන් වීමේදී ගෙවිය යුතු වන පාරිතෝ'ෂික ක්‍රමවේදයන් නොමැති වීම මත ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් සඳහා වරප්‍රසාද කමිටුව මගින් ලබා දුන් නිර්දේශ සැලකිල්ලට ගෙන සාමාන්‍යයෙන් රජයෙන් ගෙවනු ලබන 12% දායක මුදල සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩල හා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අදාල ගෙවීම් සිදු කර ඇත.
9	3.11	6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් වූ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2019 ඔක්තෝබර් 08 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ඌව පළාත් සභාවට කිසිදු සේවයක් ලබා ගැනීමෙන් තොරව රු. 14,034,374 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.	ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ අංක: පීඑස්/සීඑස්ඒ/11-18 ii හා 2022.10.28 දින නිකුත් කරන ලද චක්‍රලේඛය පරිදි අනුමත කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකුට පමණක් දැනට වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

9	4.1	2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 03 (1) ඡේදය අනුව රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු සේවා කඩවීමක් සහිතව හෝ රහිතව කලින් දැරූ තනතුරේම නැවත සේවයේ යොදවනු ලබන විටක ඔහු රාජ්‍ය සේවයේ අවසන් වරට ලැබූ වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවිය හැකි අතර 04 ඡේදය අනුව "අවසන් වරට ලද ලද වැටුප" යන්න නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ ලබමින් සිටි වැටුප ලෙස සඳහන් වේ.	ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නැවත සේවයේ පිහිටුවා ඇති විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සඳහා ගෙවිය යුතු මාසික දීමනා ගෙවීමේදී ඇතැම් නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව නිවැරදි නොවන අතර වැරදි වැඩිපුර ගෙවීමක් සිදුකර තිබේ නම් වැඩිපුර ගෙවා ඇති දීමනා අයකිරීමටත්, දීමනා ගණනය කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 3/2019 හි විධිවිධාන අනුව කටයුතු කරන ලෙසටත් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ක්‍රියාත්මක කරන ලෙසටත් ඌව පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වා ඇත

9	4.2	2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3. (11) ඡේදය අනුව රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමේදී අදාල මාසයේ පළමු දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කල යුතු වේ. එකී උපදෙස් සැලකිල්ලට නොගෙන 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් 72 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින ඉන්ධන ලීටරයක මිල ලෙස සුපිරි පෙට්‍රල්වල සහ සුපිරි ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2019 ජනවාරි මස සිට 2022 ජූලි මාසය දක්වා කාලය තුල රු.7,842,436/-ක් වැඩිපුර ගෙවා තිබුණි.	චක්‍රලේඛනයට අනුව නිශ්චිත ඉන්ධන ලීටර ප්‍රමාණයක් සඳහන් කර ඇතත් නිශ්චිත ඉන්ධන වර්ගයක් සඳහන් කර නොමැත. ඒඅනුව, විශේෂයෙන් රජයේ නව වාහන වෙනුවෙන් තාක්ෂණික නිර්දේශ අනුව විශේෂිත ඉන්ධන වර්ගයක් නියම කර ඇති අවස්ථාවලදී වාහන සඳහා එම ඉන්ධන වර්ගය භාවිතා කිරීම සිදු කරයි. ඒමෙන්ම රජයේ වහන සපයා නොමැති පෞද්ගලික වාහන භාවිතා කරන නිලධාරීන්ද ඒ අය විසින් ඔවුන්ගේ නව වාහන වලට භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගයන් යටතේ දීමනා ඉල්ලීම් කර ඒ අනුව අදාල ගෙවීම් සිදු කර ඇත. 2019 2020/2021 වර්ෂයන් වලදී මෙම ඉන්ධන වල විශාල මිල පරතරයක් නොවීම හේතුවෙන් ඔවුන් භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගයන් සඳහා අවස්ථාව ලබා දී ඇත. කෙසේ වෙතත්, පසුගිය කාලය තුලදී ඉන්ධන මිල ඉහල යාම හා ඉන්ධන හිඟය හා ඒ අනුව ඉන්ධන වර්ගයන් වෙළඳපොළ තුල නොමැති වීම, ප්‍රතිපාදන සීමා වීම සැලකිල්ලට ගෙන 2022 ජූනි මස සිට සාමාන්‍ය ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කිරීමට තීරණය කර ඒ අනුව කටයුතු සිදු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
10		රෝහල්වල ඇති කල් ඉකුත්වූ ඖෂධ තොග	මේ වන විට ස්වස්ථා පද්ධතිය හා ලිපි ලේඛන වලට අදාලව සියළුම ඖෂධ තුලනය කර ඇති අතර, කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ඇත. ඒ අනුව එම ඖෂධ තොග විධිමත් පරිදි අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදු කරමින් පවතී. මෙම කල් ඉකුත් වීම් නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් සිදු වූවක් නොවන බව ආයතන ප්‍රධානීන්ගේ ප්‍රකාශ අනුව පැහැදිලි වන අතර, ඖෂධ කල් ඉකුත් වීමෙන් සිදු වන හානිය අවම කර ගැනීම සඳහා ලබා දී තිබූ උපදෙස් අනුව දැනට රෝහල් වල ඖෂධ කල් ඉකුත් වීම Manual හා Management of Drug විධි විධාන වල දක්වා ඇති 2% ප්‍රමාණයට වඩා එනම් 0.5% කට වඩා අඩු වී ඇති බව නිරීක්ෂණය වී තිබේ.

11		පළාත් සභාවලින් බදු දී ඇති ඉඩම්වල හිඟ බදු අයකර ගැනීම	හිඟ බදු නාමලේඛනයේ නම් සඳහන් බදුකරුවන් 28 දෙනෙකුගෙන් අය කර ගන්නා ලද හිඟ බදු ආදායම රු:6,649,819.00 වේ. 2023 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද බදුකරුවන්ගේ නාම ලේඛනය හා ඔවුන්ගේ හිඟ බදු මුදල් අය ගැනීමට අදාල ඉදිරි කටයුතු සම්බන්ධ සවිස්තර වාර්තාව ඇමුණුම 05 සඳහන් කර ඇත.(ඇමුණුම 01)
12		ඌව පළාත් සභාවේ නිලධාරීන් සඳහා යෝජිත පස්මහල් නිල නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් සම්බන්ධ රුපියල් මිලියන 5 කට අධික මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබීම	දෙනුවන් ඉංජිනියරින් පුද්ගලික සමාගම 114505005-7000 දරණ වැට් ලියාපදිංචි අංකය යටතේ සක්‍රිය බදුගෙවන්නෙකු බව දේශීය ආදායම් කොමසාරිස් විසින් නිකුත් කර ඇති 2017.06.09 දිනැති ලිපිය මගින් සනාථ කර ඇත. (ඇමුණුම් අංක 01) ඒ අනුව 2017 වර්ෂයට අදාළ වැට් බදු ගෙවීම් කර ඇත.එකතු කළ අගය මත ගෙවීම් කරන ලද කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ව තහවුරු කර ගැනීම සඳහා පළාතේ ගොඩනැගිලි අධ්‍යක්ෂ විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් 2018.01.05 වන දින විමසීමක් කර ඇති අතර , ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති VAT/Audit/CF/Inc-Invi/2018/127 හා 2018.09.14 දිනැති ලිපියෙන් දෙනුවන් ඉංජිනියරින් (පුද්ගලික සමාගම) සක්‍රිය බදුගෙවන්නෙකු බව තහවුරු කර ඇත. ඒ අනුව 2018 මැයි මාසය දක්වා වැට් සඳහා පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කර්යාලයෙන් දෙනුවන් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත ගෙවීම් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එම කොන්ත්‍රාත් ආයතනය සක්‍රිය බදු ගෙවන්නෙකු නොවන බව හෝ යම් මුදලක් අය කර ගැනිමට විධානයක් නිකුත් කළේ නම් එම ආයතනයට ගෙවිය යුතු මුදලින් අයකර ගැනිමට හැකියාව තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 හා 5:4:12 වගන්ති ප්‍රකාරව අය කරන ලද වැට් බදු විස්තර 2017 අගෝස්තු මාසයේ සිට 2018 මැයි මස දක්වා දේශීය ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලදි
13		ඌව පළාත් සභාවේ පාසල් කාර්ය මණ්ඩලය	ඌව පළාත තුළ ඇති කලාප කාර්යාල 10 ය ඒකරාශී කර GOOGLE FORM මගින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මාසිකව පාසල් කාර්ය මණ්ඩලයේ තොරතුරු ලබා ගෙන ඒ අනුව කටයුතු කරන බව සඳහන් කරමි.
14		ඌව පළාත් සභා නිලධාරීන් සඳහා ඉදිකළ පස්මහල් නිලනිවාස සංකීර්ණය	කර්මාන්තයේ වත්මන් ප්‍රගතිය 70% වේ නිල නිවාස 18 කින් නිල නිවාස 07 ක වැඩ අවසන් කර පදිංචිය සඳහා භාර දී ඇත. ඉතිරි වැඩ යටතේ නිල නිවාස 08 ක් නිම කිරීමට රු.මි.31,548,124.01 ගිවිසුම් ගත වී වැඩ ආරම්භ කර ඇත.මේ යටතේ කර්මාන්තයෙන් 85% ක වැඩ නිම කිරීමට සැලසුම් කර ඇත.දැනට ක්‍රියාත්මක අධියරේ විස්තර පහත පරිදි වේ. ඇස්තමේන්තු මුදල - රු 41717100/-, ගිවිසුම් ගත මුදල - රු 31,548,124.01 , වැඩ ආරම්භ කර ඇති දිනය 2025.07.21,වැඩ අවසන් කරන දිනය 2026.01.17
15		රුපියල් මිලියන 48 වැයකර ආනයනය කරන ලද කිරි එළදෙනුන් සම්බන්ධ ව්‍යාපෘතිය	මේවන විට මුල් අවුරුද්දට සාපේක්ෂව සතුන්ගේ මීයයාම පාලනය වී ඇති අතර, විස්තර ඇමුණු 02 පරිදි වේ.
16		විගණන හා කළමනාකරණ කමිටු	ඌව පළාත තුළ විධිමත් අයුරින් විගණන හා කළමනාකරණ කමිටු රැස්ම් මේ වන විට පවත්වන බව කාරුණිකව සඳහන් කරමි.
17		ඌව පළාත් සභාව තුළ කර්මාන්ත ක්ෂේත්‍රය	ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2/UPC/5/ගි.කා.ස. සහ 2023.06.14 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත

ANUSHA GOKULA FERNANDO
Chief Secretary of Uva Province
Uva Provincial Council,

අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
ඌව පළාතේ ප්‍රධාන ලේකම්

ඇමුණුම 1

<table>
<tr><th colspan="7">ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව</th></tr>
<tr><th colspan="7">2021 වර්ෂය</th></tr>
<tr><th colspan="2">විගණන අංකය</th><th>විගණන නිරීක්ෂණය</th><th colspan="4">වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td rowspan="3">1.5.9</td><td rowspan="3">ආදායම් කළමනාකරණය</td><td rowspan="3">වාණිජ පදනමින් ලබාදී තිබුණු දීර්ඝකාලීන බදු බලපත්‍ර 88 ක් බදුකරුවන් 87 දෙනෙකුට ලබාදී තිබුණු අතර එකී බදුකරුවන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 75,776,346 ක හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝබර් 13 දිනැති අංක 2021/06 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td><td colspan="4">මෙම මුදලින් රු. 7,976,473ක මුදලක් අය වී ඇත. බදු කන්සේරු මුදල සම්බන්ධයෙන් බදුකරුවන්ගේ අභියාදනා කිරීම, බදුකරු මිය යාම, බදුකරය අහෝසිවීම සහ බදුකර සඳහා උද්ඝමන ගැළපුම් සිදු කිරීම අවශ්‍ය වීම වැනි හේතු මත මෙම හිඟ බදු අය කර ගැනීමේ බාධා පවතී. නමුත් හිඟ බදු අය කර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇති බව කාරුණිකව සඳහන් කරමි.</td></tr>
<tr><td>2021.12.31 දිනට හිඟ</td><td>ලැබුණු මුදල</td><td>ඉතිරි මුදල</td><td>අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග</td></tr>
<tr><td>75,776,346.00</td><td>7,976,473.00</td><td>67,799,873.00</td><td>බදුකරුවන් දැනුවත් කර ඇත.</td></tr>
</table>

ඇමුණුම අංක 01

උංවා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව- දීර්ඝකාලීන බදු ඉඩම් වෙනුවෙන් හිඟ බදු මුදල් අය කර ගැනීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	දීර්ඝකාලීන බදු බලපත්‍ර අංකය	දීර්ඝකාලීන බදුකරුගේ නම	හිඟ මුදල අදාළ කාල පරිච්ඡේදය	2022.12.31 දිනට හිඟ බදු මුදල	මුදල් අය වූ රිසිට්පත් අංකය වෙනත්
මහියංගනය	4/10/63298	මානොට ආරච්චිලාගේ ප්‍රියදර්ශිකා සමන් කුමාරි මිය	අවුරුදු 13 (2009.11.13-2022.11.12)	355,300.00	ලිපි ගොනුවල මුදල් ගණනය කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයන් නිසා මෙම බදුකර 2023 බදු ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත.
	4/10/63299	රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රලතා රත්නායක මිය ✓	අවුරුදු 01 (2021.11.13-2022.11.13)	72,000.00	ගෙවා ඇත (U/I C 834355)
	4/10/32223	එච්.එම්.සරත් විජේවර්ධන මයා ✓	අවුරුදු 13 (2009.11.13 - 2022.11.12)	3,427,600.00	බදුකරු මිය ගොස් ඇති අතර කලගුයා ලද තක්සේරුව අනුව බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කළ අතර නව තක්සේරුව ලැබෙන තෙක් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොමැත.
	4/10/61649	එම්.අබේරත්න මයා ✓	අවුරුදු 13 (2009.11.13-2022.11.12)	83,600.00	
	4/10/61646	එම්.අබේරත්න මයා	අවුරුදු 13 (2009.11.13-2022.11.12)	140,030.00	ලිපි ගොනුවල මුදල් ගණනය කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයන් නිසා මෙම බදුකර 2023 බදු ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත.
	4/10/60415	එස්.එච්.බෙන්ජමින් ද සිල්වා මයා	අවුරුදු 13 (2009.11.13-2022.11.12)	282,150.00	
	4/10/63543	එම්.ජී.ජී. සිදත් රෝහණ මයා	අවුරුදු 13 (2009.11.13-2022.11.12)	200,000.00	ගෙවා ඇත (U/I C 833897)
	4/10/63296	ටී.එම්. කරුණාතිලක මයා	අවුරුදු 13 (2009.11.13-2022.11.13)	24,480.00	ගෙවා ඇත (U/I C 661327)
[illegible]	බදුකරය 4883	සී.වී.එල්.සෙනෙවිරත්න	2021 සඳහා	71.00	ගෙවා ඇත (U/I C 661327) ප්‍රමාද දෝෂයක් නිසා ශත ගණන සටහන් නොවීම හේතුවෙන් 2021.12.31 දිනට 7100.00 ලෙස සඳහන් කර ඇත.

	4/10/38904	ඉංදික ප්‍රසංග වීරසිංහ	2019 සිට	83,700.00	මුල් බලපත්‍රය අවලංගු කර දීර්ඝකාලීන බදුකරයකට ගොස් ඇත. කාර්මිකාර්මික කටයුතු සඳහා බදුකරය ලබා දී ඇත. බලපත්‍රකරු බදුකරය අවලංගු කර බලපත්‍රය නැවත බලාත්මක කර දෙන ලෙස ඉල්ලා ඇත. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබයි. එබැවින් බදු මුදලක් ඇස්තමේන්තු කිරීමට හෝ අය කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැත.
	4/10/32194	ආර්.ඒ.සිරිසේන	2021 සඳහා	54,000.00	ගෙවා ඇත (U/I C 704958)
	අංක 3587	ඩබ්.බී.ඒ.චන්ද්‍රාවති(ඩබ්.ඒ.ඩී.ජේ.අප්පුහාමි)	2018 සිට මේ දක්වා	524.00	බදුකරු මිය ගොස් ඇත. පැවරීමක් සිදු වෙමින් පවතී.
	4/5/7351(වාණිජ)	මත් විශේෂලය	2021 දඩ මුදල	135,000.00	ගෙවා ඇත (U/I C 646664)
	4/10/38900	එච්.ඒ.සෙනවිරත්න	2021 සඳහා	21,800.00	ගෙවා ඇත (U/I C 646664)
	4/10/41783	ආර්.එම්.චන්ද්‍ර ජානකී ඒකනායක	2021 සඳහා	40,000.00	ගෙවා ඇත.U/I C 704797, 869581
	4/10/59/222(නේවාසික)	එච්.එම්.අනුලාවතී	2011 සිට මේ දක්වා	416,000.00	ගෙවා ඇත.U/I C 869810
	4/10/49901(කරුණාවතී)	ටී.එම්.කරුණාවතී	2019 සිට	96,000.00	ගෙවා ඇත.U/I C 704987
	4/10/51845	ජයසිංහ එදිරිසූරිය	2010 සිට මේ දක්වා	56,000.00	ගෙවා ඇත.U/I C 705230, 869555
	4/10/36889	ලේකම්, සුහද සුභ සාධක සමිතිය, බුත්තල	2014-2021	588,000.00	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි බදු ප්‍රතිශතය රජයේ තක්සේරු අනුව 2% සිට 2/1 දක්වා සංශෝධනය කරන ලදී. ඒ අනුව බදු මුදල රු. 265000.00 දක්වා අඩු විය.එම මුදල ගෙවා අවසන්ව ඇත. U/I C 747802, 748084

4/10/37728	අශෝක පද්මනාභ පල්ලෙවෙල මහතා	2020 -2021	320,000.00	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020/6 චක්‍ර ලේඛය අනුව අපි ගැන්වීමේ වට්ටම් ලබා දීම මගින් ඉතිරි මුදල රු. 304,000.00 දක්වා අඩු විය. එම මුදල ගෙවා ඇත.U/I C 747669
4/10/62071	චන්ද්‍රා නිශාන ගාමිණී විජේරත්න	2021 වර්ෂය	280,000.00	ගෙවා ඇත. U/I C 383626, 747668, 747672, 748128
4/10/27591	ඉනිටි කිරිගම බැංකුව	2021	379,750.00	ගෙවා ඇත. U/I C 653921
4/10/18867	ජයසිංහ පතිරණගේ ගාමිණී	2017-2021	**542,203.00**	ගෙවා ඇත. U/I C 658922/658977/659086/659226/659189/659261/659316/659422
4/10/26822	අඹකොන් මුදියන්සේලාගේ විජේසිරි,	2021	**1,440.00**	ගෙවා ඇත. U/I C 658974
4/10/33067	වැලිහෙලගම විජිත විවේකාශ්‍රම ආරණ්‍ය සේනාසනය, වැලිහෙලගම විජිත විවේකාශ්‍රමය, වැලිහෙලකන්ද, දියතලාව	2016-2022	**61,965.00**	ගෙවා ඇත. U/I C 659460
4/10/35281	අබේවීර ගුණරත්න පටබැඳිගේ අනිල් කුමාර, හාගොඩ, අළුත්වෙල උතුර, දියතලාව	2006-2022	**52,160.00**	ගෙවා ඇත. U/I C 659460
4/10/18812	සී/ස පැල්වත්ත සීනි සමාගම	2021	262,700.00	ගෙවා ඇත. U/I C 378959/ 817405
			7,976,473.00	
			67,799,873.00	

2021.12.31 දිනට හිඟ	75,776,346.00
ලැබුණු මුදල	7,976,473.00
ඉතිරිය	67,799,873.00

13 ක් ගෙවා නිමා කර ඇත.
2 ක් [illegible]

ඇමුණුම D 2

බොරලන්ද සත්ව ගොවිපලේ එළ ගව සතුන් සඳහා දැනට ගොවිපලේම වගා කරන ලද (වැඩි දියුණු කරන) තෘණ ආහාර,සාන්ද්‍ර ආහාර,හා නියමිත පරිදි ඖෂධ වර්ග ලබා දීමෙන් මේ වන විට සතුන් මිය යාම සිදු නොවන බවත්, කලාතුරකින් වයසට යාම නිසා එළගවයින් මිය යන අවස්ථා ඇති බව දන්වා සිටිමි.මේ වන විට සතුන්ගේ පෝෂණ මට්ටම සතුටුදායක මට්ටමේ පවතින බවද පහත සඳහන් පරිදි සතුන්ගේ තොරතුරු ඉදිරිත් කරමි

<u>ආනයනික එළගව ඒකකය</u>

1	2024.12.31 දිනට ආනයන්ක එළ ගව ඒකකයේ ශේෂය	48
2	මිය ගිය දෙනුන් ගණන	03
3	2025 වර්ෂයේ විකුණූ සතුන් ගණන	19
4	2025.08.04 දිනට ඉතිරි ආනයනික ගවයින් සංඛ්‍යාව	26

<u>එළගව ඒකකයේ සත්ව සංයුතිය</u>

1	2025.08.04 දිනට ඉතිරි ආනයනික ගවයින් සංඛ්‍යාව	26
2	අවුරුද්දට වැඩි නැම්බියන්	18
3	අවුරුද්දට අඩු වැස්සි පැටව්	12
4	ආනයනික දෙනුන්ගෙන් මෙරට ඉපදී පැටව් දැමූ දෙනුන්	04
5.	ආනයනික දෙනුන්ගෙන් මෙරට ඉපදුණු අවුරුද්දට අඩු වසු පැටව්	08

2025.08.04 දිනට ආනයනික එළ ගව ඒකකයේ සංයුතිය -68

දෛනික කිරි නිෂ්පාදනය ලීටර් - 90 කි.